# විෂය - චිත්‍ර

10 ශ්‍රේණිය **කාර්ය පත්‍රිකා අංක I** III වාරය

---

6.4.1. පාඩම ඇසුරින් - කාලච්ඡේද 01

## “ඩේවිඩ් පේන්ටර් ශිල්පියාගේ නිර්මාණ අගයමු. ”

❖ **නිපුණතා මට්ටම**

- ඩේවිඩ් පේන්ටර් ශිල්පියාගේ නිර්මාණ ගවේෂණය කරයි.
- මොහුගේ චිත්‍රවල විවිධ ශෛලීය ලක්ෂණ විස්තර කරයි.
- යුරෝපිය ශාස්ත්‍රාලීය චිත්‍ර කලාවේ ස්වභාවිකවාදී චිත්‍ර කලා ආභාෂය මොහුගේ නිර්මාණ වලට ආභාෂය වී ඇති බැවින් එම නිර්මාණ මොනවාද යන්න විස්තර කරයි.

❖ **ඉගෙනුම් අත්වැල**

- නිර්මාණ වර්ගීකරණයේදී වස්තු විෂය අනුව ප්‍රතිරූප, භූමි දර්ශන, මානව රූප සම්පින්ඩණය. ත්‍රිත්ව දෙව්මැදුරේ බිතු සිතුවම් ලෙස වර්ගීකරණය වී ඇති බව
- ශිල්පියාගේ නිර්මාණ ශෛලීය හා චිත්‍ර මූලිකාංග සංරචණය කිරීමේ ලක්ෂණ කවරාකාරද යන වග,

❖ **ඩේවිඩ් පේන්ටර් ශිල්පියාගේ වර්ණ චිත්‍ර**

- **ජයග්‍රාහී ලෙස ජෙරුසලමට ඇතුළු වීම.**
  - ජාතික කලාභවනේ නිත්‍ය ප්‍රදර්ශනයේ පවතී.
  - කැන්වසය මත තෙල් සායම් මාධ්‍යය වේ.
  - හැඟීම් ප්‍රකාශනයෙන් යුතුයි.
  - ගැඹුර හා පර්යාලෝක ලක්ෂණ යොදා ඇත.
  - දීප්තිමත් වර්ණ මාලාවක් භාවිත කර ඇත.
  - පසුබිම සඳහා ජෙරුසෙලම් කාන්තාරය වෙනුවට ලාංකික වියළි කලාපීය කඳු භූ පරිසරයක් යොදා ඇත.

- **යහපත් සමරිතානුවරයා**
  - මෙම සිතුවම මහනුවර ත්‍රිත්ව දෙව් මැදුරේ දැකිය හැක.
  - මින් නිරූපණය වන්නේ ජේසුස්වහන්සේ දේශනා කරන ලද උපමා කතාවක අවස්ථාවකි. එනම් යහපත් සමරිතානුවරයා පහරදීමකට ලක්වී තුවාල ලැබූ පුද්ගලයෙකු හට පිහිටවන ආකාරයටයි.
  - මෙම සිතුවමේ යුරෝපීය සංස්කෘතිය හා භූ තලය වෙනුවට ලාංකේය සමාජ පසුබිම නිරූපණය වේ.
  - චිත්‍රයේ ගැඹුර පර්යාවලෝක ලක්ෂණ හා පසුබිම නිරූපණය වේ.
  - චිත්‍රයේ ගැඹුර පර්යාවලෝක ලක්ෂණ හා ත්‍රිමාණ ලක්ෂණ භාවිතාකර ඇත.

## ❖ ඩේවිඩ් පේන්ටර් ශිල්පියාගේ සිතුවම්වල පොදු ලක්ෂණ

- ජීවගුණය හා කායික සුන්දරත්වය මැනවින් පිළිඹිබු වන ලෙස මානව රූප චිත්‍රණය
- චිත්‍රයේ ගැඹුර හා පර්යාවලෝක ලක්ෂණ නිරූපණය
- මිනිස් ඉරියව් ලාලිත්‍යයෙන් හා හැඟීම් ප්‍රකාශනයෙන් යුතුයි.
- දීප්තිමත් වර්ණ මාලා භාවිතය
- ක්‍රිස්තියානි තේමා නිරූපණය කිරීමේදී යුරෝපීය සංස්කෘතිය හා භූතලය වෙනුවට ශ්‍රී ලාංකීය සමාජ පසුබිමක චිත්‍රණය කර තිබීම.

## ❖ ඇගයීම

- ඩේවිඩ් පේන්ටර්ගේ නිර්මාණ සඳහා වස්තු විෂය වූ තේමා නම් කරන්න.
- එම සිතුවම්හි පොදු ලක්ෂණ විස්තර කරන්න.
- යහපත් සමරිතානුවරයා සිතුවම සඳහා වස්තු විෂය වූයේ කිනම් අවස්ථාවකද?
- පහත සඳහන් කරුණු යටතේ ඩේවිඩ් පේන්ටර් ශිල්පියාගේ ජයග්‍රාහී ලෙස ජෙරුසලමට ඇතුළුවීම නිර්මාණය ඇගයීමට ලක් කරන්න.

  I. ශෛලීය

  II. ආභාෂය

  III. මාධ්‍ය භාවිතය

  IV. කලා ලක්ෂණ
  - ★ රූප භාවිතය
  - ★ වර්ණ භාවිතය
  - ★ තලය භාවිතය
  - ★ භාව ප්‍රකාශනය
  - ★ පේන්ටර් ශිල්පියාගේ ප්‍රසිද්ධ නිර්මාණ හා ඒවා හමුවන ස්ථාන නම් කරන්න.

**විෂය - චිත්‍ර**

10 ශ්‍රේණිය **කාර්ය පත්‍රිකා අංක II** III වාරය

---

7.3.1. පාඩම ඇසුරින් - කාලච්ඡේද 01

**"ඉන්දු නිම්න ශිෂ්ඨාචාරයේ නිර්මාණ අගයමු. "**

❖ **<u>නිපුණතා මට්ටම</u>**

- ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ කලා නිර්මාණ ගවේෂණය කරයි.
- නිර්මාණවල ඓතිහාසික පසුබිම විස්තර කරයි.
- ඉන්දු නිම්න මූර්ති හා කැටයම් නම් කර මාධ්‍යය හා ශිල්ප ක්‍රම විස්තර කරයි.
- ඉන්දු නිම්න කලා නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

❖ **<u>ඉගෙනුම් අත්වැල</u>**

- ඉන්දු නිම්න ශිෂ්ටාචාරය මෙසපොටේමියානු මිසර වැනි පූර්ව ඓතිහාසික ශිෂ්ටාචාර හා සමානත්වයෙහි ලා සැළකිය හැකි බව
- මෙම ශිෂ්ටාචාරය මොහෙන්ජදාරෝ හා හරප්පා නගර මුල් කර ගනිමින් නිර්මාණය වී ඇති බවත්, එම වැසියන් උසස් කලා කෞශල්‍යයෙන් යුක්ත ජන කොටසක් බව.
- හමුවී ඇති නිර්මාණ ගල් හා ලෝහ ප්‍රතිමා ආභරණ හා මෙවලම් මුද්‍රා, සෙල්ලම් බඩු වාස්තු විද්‍යා නිර්මාණ ලෙස වර්ගීකරණය කළ හැකි බව
- ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් හමු වී ඇති නිර්මාණ ඉහළ (දියුණු) කලා ලක්ෂණ පැහැදිලිව විස්තර කරයි.

❖ **<u>ඉන්දු නිම්න ශිෂ්ටාචාර මූර්ති</u>**

**<u>පූජක රුව</u>**

- මොහෙන්ජොදාරෝ නගරයෙන් සොයාගෙන ඇත.
- මෙමගින් පූජකයෙකුගේ උඩුකය දැක්වේ.
- 19 cm උස මෙය සුදු හුණු ගලින් නිමවා ඇත.
- ඒකාංශ කරන ලද සළුව පෙති තුනක මලක හෝ කොළයක හැඩය ගත් රටාවකින් සරසා ඇත. නළල මත ගාංචුව සහිත නළල් පටියකි.
- අඩවන් දෙනෙත් හා හිස අඩක් මුඩු කොට තිබීම මෙම රූපය භාවනායෝගී පූජක රුවක් ලෙස හැඳින්වීමට හේතු වේ.
- ශෛලීගත සම්ප්‍රදායන් අනුව නිරූපණය කරන හැඩතල මෙහි දක්නට ඇත.

## ❖ නළඟන

- ඉන්දු නිම්න වැසියෝ ලෝහ වාස්තු කිරීමේ තාක්ෂණයෙන් පරිණතව සිටි බවට මෙම ලෝහයෙන් කරන ලද නළඟන රුව හොඳම සාධකයකි.
- පූර්ණ උන්නතව නිමවා ඇති මෙහි උස අඟල් 4 1/2 කි.
- කෙසඟ නග්න රුවක් වූ මෙම කාන්තා රුව කලාත්මකය.
- ඇස් අඩවන්ය. ප්‍රකෝපකාර ඉරියව්වකින් සිට ගෙන එක් අතක් ඉනෙහි තබාගෙන එක් කකුලක් අඩක් නැමී සිටින ආකාරයෙන් නිමවා ඇත.
- මෙයින් දෙවොලක රඟන ස්ත්‍රියක් නිරූපණය වේ යැයි මතයයි. දැනට නවදිල්ලි ජාතික කෞතුකාගාරයේ තැන්පත් කොට ඇත.

## ❖ රතුවැලි ගලින් කළ කවන්ධ මිනිස් රුව

- මානව දේහයේ සුන්දරත්වය ඉතා සියුම්ව දක්වා ඇති කවන්ධ මිනිස් රුව ඉන්දුනිම්න ශිෂ්ඨාචාරයෙන් හමුවූ උසස් නිර්මාණයකි.
- ග්‍රීක සම්භාව්‍ය කෘතිවල මූර්තිමය ලක්ෂණ දක්නට ඇත.
- අඟල් 04 ක් පමණ උසය. රතු හුණු ගලින් පූර්ණ උන්නතව නිමවා ඇත
- ශිවගේ මූලාදර්ශයක් වශයෙන්ද හඳුන්වයි. (අත් හතරක සාධක මූර්තියෙන් හමුවන බැවින්)

## ❖ අළුවැලි ගලින් කළ කවන්ධ මිනිස් රුව

- හරප්පාවෙන් හමුවන මෙම කවන්ධ මිනිස් රුව පූර්ණ උන්නත ශිල්ප ක්‍රමයට අළුවැලි ගලින් නිර්මාණය කර ඇත.
- උස 10 cm කි. වම් කකුළ ඉදිරියට ඔසවාගෙන සිටින නර්තන විලාශයක් පෙන්නුම් කරයි.
- නටරාජා නර්තන ස්වරූපය පෙන්නුම් කරන බව විචාරක අදහසයි.
- ග්‍රීක, රෝම, සම්භව්‍ය මූර්ති නිර්මාණවල දක්නට ලැබෙන ස්වභාවික තාත්වික ලක්ෂණ මෙම කවන්ධ රූපයෙන් ප්‍රකට වේ.

## ❖ ඉන්දු නිම්න ශිෂ්ටාචාර මුද්‍රා

- මුද්‍රා 200 කට අධික සංඛ්‍යාවක් හමුවී ඇත.
- දිගටි හා අටපට්ටම්, සතරැස් හා අටපට්ටම්, සතරැස් හැඩවලින් යුක්තය.
- රූපවලට අමතරව අක්ෂර මුද්‍රා මත දැකිය හැක.
- වෙළඳ භාණ්ඩවල ඇසුරුම් සලකුණු වශයෙන් යෙදීමට මෙම මුද්‍රා භාවිත කළ බව අනුමාන කරයි.
- මොල්ලිය සහිත ගව රූපය හා පශුපති මුද්‍රා ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් හමුවන සුවිශේෂී මුද්‍රා වේ.

## ❖ ඇගයීම

- ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් හමුවන සුවිශේෂී මූර්ති නම් කරන්න.
- මෙම ශිෂ්ටාචාරයේ භාවිත මුද්‍රා පිළිබඳ විස්තර කරන්න.
- ඉන්දු නිම්න වැසියන්ගේ ලෝහ භාවිතය හා තාක්ෂණය පිළිබඳ පැවති පරිණත බව පෙන්නුම් කරන නිර්මාණය කුමක්ද?
- ඉන්දු නිම්න වැසියන්ගේ විවිධ මාධ්‍යය භාවිතය හා ශිල්ප ක්‍රම යොදා ගැනීම පිළිබඳ සුදුසු උදාහරණ යොදා ගනිමින් විස්තර කරන්න.
- ඉන්දු නිම්න ශිෂ්ටාචාරය ගොඩනැගී ඇත්තේ කිනම් නගර මුල් කරගෙනද?

**විෂය - චිත්‍ර**

10 ශ්‍රේණිය **කාර්ය පත්‍රිකා අංක III** III වාරය

---

**6 16 පාඩම ඇසුරින් කාලච්ඡේද 01**

**"පෙරියතම්බි සුබ්‍රමනියම් කලාකරුවාගේ නිර්මාණ අගයමු."**

### ❖ නිපුණතා මට්ටම

- සුබ්‍රමනියම් ශිල්පියාගේ සිතුවම් දක්නට ලැබෙන ස්ථාන හා එම සිතුවම් නම් කරයි.
- එම නිර්මාශීලි කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.
- හින්දු ආගමික චිත්‍ර කලාවේ නම ශෛලියක් ඇති කළ චිත්‍ර ශිල්පියෙකු බව ප්‍රකාශ කරයි.
- සිතුවම් ඇඳීමේ දී ශිල්පියාට ලැබුණු බලපෑම් / ආභාෂ විස්තර කරයි.

### ❖ ඉගෙනුම් අත්වැල

- දෙමළ ජනතාවගේ එදිනෙදා ජීවිත අවශ්‍යතාවන් සමග බැඳී අභිලාෂයන් ඉටු කළ චිත්‍ර ශිල්පියෙකු බව.
- රවි වර්මාගේ චිත්‍රවල දක්නට ලැබෙන දෘෂ්ටි මායා ප්‍රකාශන ශිල්ප ක්‍රමය සුබ්‍රමනියම්ගේ නිර්මාණ සඳහා අනුගමනය කළ බව.
- සුබ්‍රමනියම් ශිල්පියා කෝවිල් බිත්ති, තිර රෙදි, විශාල ප්‍රමාණයේ බැනර් හා කටවුට් නිර්මාණය කළ බව.

### ❖ පෙරියතම්බි සුබ්‍රමනියම් ශිල්පියාගේ සිතුවම් කෝවිල් ආශ්‍රිතව දැකිය හැකිය.

- නල්ලූර් කෛලාසපිල්ලෙයාර් කෝවිල.
- ඉනුවිල් පරරාසසේකර පිල්ලෙයාර් කෝවිල.
- සුදුමලයි අම්මන් කෝවිල.
- වැල්වේට්ටිත්තරෙයි සිවන් කෝවිල.
- නල්ලූර් වීර කාලි අම්මන් කෝවිල.
- වේලණෛයි අම්මන් කෝවිල.

### ❖ අගස්තියර් හා විනායගර් සිතුවම

- පරරාසමස්කර පිල්ලෙයාර් කෝවිලෙහි දැකිය හැකි සිතුවමකි.
- මෙම නිර්මාණයෙන් අගස්තියර්ගේ කෙණ්ඩියට කපුටු වෙසින් පැමිණි විනායර් තට්ටු කළ නිසා හටගත් කාවේරි නදියගේ කතා පුවත අවස්ථා තුනකින් යුතුව දක්වා ඇත.
- හුණු බිත්තිය මත තලය සකස් කිරීමකින් තොරව එනමල් වර්ණ යොදා නිර්මාණය කර ඇත.
- රූප ත්‍රිමාණ ලක්ෂණ සහිත වර්ණවල තානය මගින් ගොඩනංවා ඇත.
- කොටස් 03 කින් යුක්ත මෙම සිතුවමෙහි එක් එක් කොටසින් එකිනෙකට වෙනස් හැඟීම් දක්වයි. පෙරබිමේ ඇති රූපවල ක්‍රියාකාරකම්වලට උචිත පරිදි පසුබිමේ දර්ශන දක්වා ඇත.

## ❖ ඇතා වල්ලිව එළවාගෙන යාම.

- සුබ්‍රමනියම්ගේ මෙම සිතුවම ඉනුවල් පරරාසසේකර පිල්ලෙයාර් කොවිලෙහි දක්නට ඇත.
- ඇත් වෙසින් පැමිණි විනායගර්, වල්ලි එලවාගෙන යනු ලබන අතර වල්ලි, තාපස වෙසින් පැමිණි මුරුගන්ගෙන් පිළිසරණ ලැබීම මෙම සිතුවමෙන් නිරූපිතය.
- බිත්තියෙහි තලය සකස් කිරීමකින් තොරව එනමල් වර්ණයෙන් සිතුවම් කර ඇත.
- ඇතාගේ භායනක ස්වරූපය හා වල්ලිගේ බියමුසු හැඟිම් මෙමඟින් නිරූපණය වන අතර ත්‍රාසය හා බියමුසු හැඟිම් මනාව ප්‍රකාශ වේ.

## ❖ ඇගයීම්

I. පෙරියතම්බි සුබ්‍රමනියම් ශිල්පියාගේ සිතුවම් දැකිය හැකි කෝවිල් නම් කරන්න.
II. සුබ්‍රමනියම් ශිල්පියාගේ සිතුවම් නම් කරන්න.
III. "මොහු හින්දු ආගමික චිත්‍ර කලාවේ නව ශෛලියක් ඇති කළ චිත්‍ර ශිල්පියෙකි." ඒ කියමන සනාථ කිරීමට උදාහරණ යොදා ගනිමින් විස්තර කරන්න.
IV. ඇ වල්ලිව එළවාගෙන යාම සිතුවම දැකිය හැක්කේ කිනම් කෝවිලෙහි ද?
V. අගස්තියර් හා විනායගර් සිතුවමට වස්තු විෂය වූයේ කිනම් කතා පුවත ද?